**වැල්ලවාය ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 29 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------------- | --------------- | -------------------- |
| (i) | සභාවට අයත් ඉඩම් කැබලි 69 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සියළු වත්කම් ගිණුම් ගතකළ යුතුවේ. | 2020 වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කර තක්සේරු කරන බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ මුද්දර ගාස්තු රු.12,582,422 ක් වුවද, එය රු. 12,649,633 ක් ලෙසට රු. 67,211 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව දන්වමි. |

**(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------------- | --------------- | ---------------------- |
| රු. 253,886,540 ක වත්කම් විෂයයන් 03 ක් සඳහා තක්සේරු වාර්තා, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, ආදායම් ලේඛන සහ උපලේඛන විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | වත්කම් තක්සේරු කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් තක්සේරුකරුවන් බඳවා ගැනීමට නියමිත බැවින් ඒ අනුව කටයුතු කරන අතර, ආදායම් ලේඛන |

සොයාගත නොහැකි බව දන්වමි.

**1.4** <u>අනුකූල නොවීම්</u>

<u>**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**</u>

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 19 (xii)වගන්තිය | ප්‍රාදේශීය සභාවට අයත් කඩකාමර 58 ක් වසර 30ක කාලයක් සඳහා බදු පදනම මත ලබාදී තිබුණද ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුවේ. | මෙම කඩ කාමර ඉදිකිරීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුකර ඇති බැවින් බදුදීමට අදාල මූලික කටයුතු ද එම ආයතනය සිදුකර ඇති බව දන්වමි. |
| (ii) 140 වගන්තිය | වරිපනම් බදු අයකිරීම සඳහා දේපල කාලීනව තක්සේරු නොකර 2012 වර්ෂයේ තක්සේරුවක් මත සමාලෝචිත වර්ෂයටද වරිපනම් බදු අයකර තිබුණි. | පනතේ නියමිත විධිවිධාන ප්‍රකාරව තක්සේරු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී තක්සේරු කරන බව දන්වමි. |
| (ආ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | |
| 571 | එකතුව රු. 2,234,942 ක් වූ වර්ෂ දෙකකට වැඩි තැන්පත් ශේෂ 72 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තැන්පත්කරුවන්ට මුදල් ලබා ගන්නා ලෙස ලිඛිතව දැනුම් දී ඇති අතර ආරක්ෂිත ඇප තැන්පත් ආපසු ගෙවීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය</u> | | | |
| XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය | වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට ගිණුම්වල දැක්වෙන සභාවේ සේවය කළ සේවකයින් 55 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 132,098 ක සේවක ණය අයකර නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ණය ශේෂවලට සම්බන්ධ නිලධාරීන් බොහොමයක් විශ්‍රාම/මිය ගොස් ඇති අතර ඒ අනුව ණයකරුවන් හෝ ඇපකරුවන් පිළිබඳව |

| | | | |
|---|---|---|---|
| | | | කිසිදු තොරතුරක් සොයා ගත නොහැකි නම් ගිණුම්වලින් කපා හැරීමට අනුමැතිය ලබාගැනීම සඳහා විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුව ඇත. |
| (ඇ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය | 2014,2015 සහ 2016 වර්ෂවල දී අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 41 කට අදාල අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව ඉදිකිරීම් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කළ යුතුවේ. | අනුකූලතා සහතික ලබා ගන්නා ලෙස අදාල පුද්ගලයින් ලිඛිතව දැනුවත්කර ඇත. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,196,471 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු. 13,066,419 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්පත් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,046,500 | 6,046,520 | 2,344,739 | 3,701,781 | 6,055,383 | 6,046,520 | 2,234,195 | 3,812,326 |
| (ii) | කුලී | 19,577,253 | 10,289,853 | 6,824,672 | 3,465,181 | 15,600,000 | 10,443,422 | 7,066,285 | 3,377,137 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 12,020 | 1,510,828 | 1,468,828 | 42,000 | 1,150,000 | 1,011,150 | 1,010,150 | - |
| (iv) | වෙනත් ආදායම් | 2,279,250 | 1,413,119 | 1,413,119 | - | 1,759,150 | 1,665,345 | 1,665,345 | - |
| | **එකතුව** | 27,915,023 | 19,260,320 | 12,051,358 | 7,208,962 | 24,564,533 | 19,166,437 | 11,975,975 | 7,189,463 |

**2.2.2** <u>වරිපනම් හා බදු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | --------------- | ------------------------ |
| (අ) | වරිපනම් බදු අය කිරීමට යටත් ප්‍රදේශ 1986 වර්ෂයේදී හඳුනාගෙන තිබුණු අතර, කලින් කළ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකළ හැකි ප්‍රදේශය පුළුල් කර ගැනීමට සභාවේ අවධානය යොමුවී නොතිබුණි. | කලින් කළ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකළ හැකි ප්‍රදේශය පුළුල් කර ගත යුතුවේ. | 2020 වර්ෂයේ දී නව දේපල තක්සේරුවක් සිදුකර දියුණු කළ ප්‍රදේශ පුළුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට බිල් කරන ලද රු. 6,046,032 ක් වූ වරිපනම් බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට රු. 3,791,132 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 63 ක් විය. එමෙන්ම සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 10,473,959 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුළදී රු. 7,824,260 ක් අයකරගෙන නොතිබුණු අතර එය වර්ෂය ආරම්භයේ පැවති හිඟ මුදලින් සියයට 75 ක් විය. වරිපනම් බදු රැස්කිරීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණු අතර රු.10,000 ට වැඩි මුදලක් සහිත ඒකක 287 කින් රු. 7,453,867 ක් අයවිය යුතුව පැවතුණි. | හිඟ වරිපනම් බදු අයකරගත යුතුවේ. | ආදායම් පරීක්ෂක නිලධාරීන්ගේ සේවාව ප්‍රමාණවත් පරිදි නොලැබීම, වරිපනම් තක්සේරුව සඳහා බදුකරුවන්ගේ සහ වෙළඳ සංගමයේ විරෝධතා මතුවීම හේතුවෙන් හිඟ අයකිරීම අඩුවී ඇත. හිඟ මුදල් අයකිරීමට විශේෂ කණ්ඩායමක් යොදවා ඇති අතර, සියළුම සභිකයින් නව තක්සේරුවක් කිරීමට විරෝධය දක්වා ඇත. හිඟ අයකිරීමට නිවේදන නිකුත් කිරීමේදී දේශපාලන අධිකාරියේ උපදෙස් මත තාවකාලිකව එය නතර කිරීමට සිදු වුවත් හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.3** <u>දේපල බදු ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------------- | -------------- | ------------------- |

| | | |
|---|---|---|
| සභාවට අයත් දේපල 13 ක් බදුදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ සඳහා අයවිය යුතු රු. 4,742,640 ක කුලී අයකර නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගත යුතුවේ. | සමාලෝචිත වර්ෂයට අදාල හිඟ මුදලින් රු. 350,458 ක් අයකර ඇත. ආදායම් පරික්ෂකවරු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් හිඟ මුදල් අයකර ගැනීමේ දුර්වලතා පැවති අතර ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කරමි. |

**2.2.4** <u>කඩකාමර කුලී</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාවට අයත් බදුදී ඇති කඩකාමර 96 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 4,942,405 ක කුලී අයකර නොතිබුණි. තවද කඩා ඉවත්කර තිබුණු කඩ කාමර 16 කින් කඩා ඉවත් කිරීමට පෙර අයවීමට තිබුණු රු. 22,175 ක් අයකර නොතිබුණි. | හිඟ කුලී අයකරගත යුතුවේ. | මාර්තු මස වන විට රු. 298,435 ක් අයකර ඇත. කඩ කුලී තක්සේරුව සම්බන්ධයෙන් කඩහිමියන්ගේ විරෝධය මත හිඟ මුදල් අයකර ගැනීමට නොහැකිවී ඇති අතර ඉදිරියේදී නීතිමය කටයුතු කරන බව දන්වමි. |

**2.2.5** <u>දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ආදායම්</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ ස්ථාපනය කර ඇති පෞද්ගලික ආයතන 06 කට අයත් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 16 වෙනුවෙන් 2017 සිට 2019 වර්ෂය දක්වා අයකරගතයුතු රු.84,000 ක බදු මුදල් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | 2017 වර්ෂයේ හිඟ මුදලින් රු. 24,000 ක් අයකරගෙන ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.6** <u>ස්ථාවර ප්‍රචාරන දැන්වීම් පුවරු ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂය සහ සමාලෝචිත වර්ෂය තුළ සභා බලප්‍රදේශයේ ස්ථාපනය කර තිබුණු දැන්වීම් පුවරු 38 ක් වෙනුවෙන් අයවිය යුතු රු. 530,887 ක දැන්වීම් පුවරු ගාස්තු අයකර නොතිබුණි. | හිඟ මුදල් අයකරගත යුතුවේ. | දැන්වීම් පුවරු 17 ක මුදල් අයවී ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.7** <u>වෙනත් ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් යන්ත්‍රෝපකරණ 2013 සිට 2019 වර්ෂ දක්වා කුලියටදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 634,320 ක් අයකර නොතිබුණි. | හිඟ යන්ත්‍ර කුලී අයකරගත යුතුවේ. | අයවිය යුතු පර්ශවයන් වෙත දැනුවත්කර ඇති බව දන්වමි. |

**2.2.8** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු උසාවි දඩ රු. 4,719,260 ක් හා මුද්දර ගාස්තු රු. 12,649,633 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකරගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට උපලේඛන සකස්කර අදාල ආයතන වෙත යොමුකර ඇති බව දන්වමි. |

**3.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙලකර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වූ ක්‍රියාකාරකම් 38 ක් ඉටුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටු කළ යුතුවේ. | අපේක්ෂා කළ ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් කසළ බැහැරකරන ආනපල්ලම ඉඩමේ අයිතිය ප්‍රාදේශීය සභාවට ලබාගෙන නොතිබුණු අතර දිරන කසල භාවිතා කර කාබනික පොහොර නිපදවීමට කටයුතුකර නොතිබුණි. | මෙම ඉඩමේ අයිතිය පවරා ගතයුතු අතර, කාබනික පොහොර නිපදවීමටද කටයුතු කළ යුතුවේ. | කසළ අංගනය ඉදිකිරීමෙන් පසු ඉඩම පවරා ගත හැකි බව හා කාබනික පොහොර නිපදවීම ආරම්භ කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉදිරියේදී දර්ශක හඳුනාගෙන ඒ අනුව ක්‍රියාත්මක කිරීමට යෝජිත බව දන්වමි. |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කඩ කාමර 07ක බදු අයිතිය පැවරීමට ඉල්ලීම් කරන ලද ලිපිගොනු නීතිඥයන්ට භාරදී මාස 06 | බදු අයිතිය පැවරීමට කටයුතු කළ යුතුවේ. | ලිපිගොනු නැවත ලබාගෙන නෛතික |

| | | | |
|---|---|---|---|
| | සිට අවුරුදු 04 ක කාලයක් ගතවී තිබුණද එම ලිපිගොනු ආපසු ලබාගෙන බදු අයිතිය පැවරීමට කටයුතු කර නොතිබුණි. | | කටයුතු වෙනත් නීතිඥයෙකු මගින් සිදුකරන බව දන්වමි. |
| (ආ) | සභා බලප්‍රදේශය තුල ත්‍රී රෝද රථගාල් 7ක් ස්ථාපනය කිරීමට ස්ථාන හඳුනාගෙන තිබුණද ඒ සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අය කිරීමට කටයුතුකර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ගැසට් පත්‍රයේ පලකිරීමට නියමිතව තිබියදී පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් පොදු ව්‍යවස්ථාවක් සකස් කර ගැසට් කිරීමෙන් පසු එය වැළඳ ගන්නා ලෙසට උපදෙස් ලබා දුන් බව දන්වමි. |
| (ඇ) | ප්‍රාදේශීය සභාවට අයත් වැල්ලවාය නගරයේ පිහිටි සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩකාමර 10 ක් හා බස් නැවතුම්පලේ උඩුමහලේ පිහිටි කඩකාමර 03 ක් බදුදීමට කටයුතුකර නොතිබුණි. | කඩ කාමර බදුදීමට කටයුතු කළ යුතුවේ. | ලංසු කරුවන් ඉදිරිපත් වී නොමැති බැවින් මේ පිළිබඳව මාසික සභා රැස්වීමට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට නියමිතව ඇත. |
| (ඈ) | ප්‍රාදේශීය සභාවට අයත් කඩකාමර 17 ක් බදුදීමේදී බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹිය යුතුවේ. | අවස්ථා කිහිපයකදී මේ පිළිබඳව කඩහිමියන්ට දැනුම්දී ඇතත් මේ දක්වා ගිවිසුම්ගත වී නොමැති බැවින් මහ සභාවට යොමුකර ඇත. |
| (ඉ) | 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන ගැසට් පත්‍රයේ සඳහන් කසළශෝධන අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන කසළ ඉවත්කිරීම සඳහා බදු අයකිරීමට ප්‍රසිද්ධකර තිබුණු නමුත් කසළ බදු අයකර නොතිබුණි. | කසළ බදු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | කසළ බැහැර කරන ස්ථානයේ පවතින ගැටළුව නිසා කසළ වෙන් කර ලබාගත නොහැකි බැවින් කසළ බදු අය නොකරන බව දන්වමි. |
| (ඊ) | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ක්‍රියාකාරකම් 11 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා නොදීම් නිසා එක් බලපත්‍රයකට රු. 4,000 බැගින් රු. 44,000 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි. තවද කල් ඉකුත්ව තිබූ බලපත්‍ර 75 ක වලංගු කාලය අලුත් කිරීමට කටයුතු නොකිරීම නිසා එක් බලපත්‍රයකට රු. 4,000 බැගින් රු. 300,000ක ආදායමක් අහිමිවී තිබුණි. | මෙම ව්‍යාපාර පරීක්ෂා කර නියමිත ගාස්තු අයකර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතුවේ. | මේ පිළිබඳව කර්මාන්ත හිමියන් දැනුවත් කර ඇති අතර කල් ඉකුත් වූ බලපත්‍රවලට අදාල කර්මාන්ත පිළිබඳව තහවුරු කර ගැනීමට ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීමට නොහැකි වූ බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ සහා බලප්‍රදේශය ආවරණය වන පරිදි අනවසර ඉදිකිරීම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් හඳුනාගැනීමට සමික්ෂණයක් සිදුකළ යුතුවේ. | වැල්ලවාය නගරයේ අනවසර ඉදිකිරීම් ඉවත් කළ බවද, 2020 වර්ෂයේදී සහා බලප්‍රදේශය ආවරණය වන පරිදි සමීක්ෂණයක් සිදුකරන බව දන්වමි. |

**3.3** <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | ------------------ |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු 9 කට අදාලව පුරප්පාඩු 10 ක් පුරවා නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවාගත යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත තොරතුරු යවා ඇති බව දන්වමි. |

**3.4** <u>වත්කම් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------- | ------------------ |
| (අ) | සභාවට අයත් පුස්තකාල 04 ක් විසින් 2001 වර්ෂයේ සිට පාඨකයින්ට නිකුත්කර තිබුණු රු. 62,471 ක් පිරිවැය වූ පුස්තකාල පොත් 412 ක් නැවත ලබාගෙන හෝ ඒ වෙනුවෙන් මුදල් අයකරගෙන හෝ නොතිබුණි. | පුස්තකාල පොත් නැවත ලබා ගැනීමට හෝ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉතිරි පොත් ලබා ගැනීමට හෝ මුදල් අයකර ගැනීමට අවස්ථා කිහිපයකදී ලිපි මගින් අවසන් නිවේදන යවා ඇති අතර ලිපිනයන් වෙනස්වීම වැනි හේතු මත ලිපි ආපසු ලැබී ඇත. |
| (ආ) | සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සමීක්ෂණයක් සිදු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී සමීක්ෂණයක් සිදුකරන බව දන්වමි. |
| (ඇ) | සභාවට අයත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු ඉඩම් කැබැලි 57 ක මැනුම් කටයුතු සිදුකර හෝ නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන හෝ නොතිබුණි. | සභාවට අයත් ඉඩම්වල මැනුම් කටයුතු කර නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුවේ. | අවස්ථා කිහිපයකදී ඉඩම් පවරා දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කර ඇති අතර ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වට්ටෝරු ලේඛනවල ඇතුළත් කදන් 28 කට අයත් ඉරු තේක්ක දැව 2015 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන ගබඩාකර තිබුණි. | ඉරු තේක්ක දැව ප්‍රයෝජනයට ගතයුතුවේ. | පෙර පාසල්වල ඩෙස් පුටු සකස් කිරීමට ඉදිරියේදී යොදා ගනිමි. |
| (ඉ) | අවසන්වරට 2014 වර්ෂයේදී යාවත්කාලීන කර තිබුණු මාර්ග ඉන්වෙන්ට්‍රිය අනුව මාර්ග 235 ක් පැවති අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය අනුව එම මාර්ග ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතුකර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනකර ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කළ යුතුවේ. | සභාව සතු මාර්ග තව දුරටත් හඳුනාගෙන ගැසට්කර මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනකරන බව දන්වමි. |

**(ඊ)** <u>වාහන උපයෝජනය</u>

<u>ඇස්තමේන්තු හා නිමි වැඩ වාර්තා පිළියෙල නොකිරීම</u>

| | | |
|---|---|---|
| සභාවට අයත් යන්ත්‍ර 4 ක් සහ එක් වාහනයක් 2019 ජනවාරි 01 සිට අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුල රු. 1,894,855 ක ඉන්ධන වියදම් දරා මීටර් පැය 1918.6 ක් ධාවනය කර, කර්මාන්ත 165 ක් ඉටුකළ බව දෛනික ධාවන සටහන්වල දක්වා තිබුණි. එහෙත් එම කර්මාන්ත සඳහා නිමි වැඩ වාර්තා සහ ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | ඇස්තමේන්තු හා නිමි වැඩ වාර්තා පිළියෙල කළ යුතුවේ. | කොට්ටාස 13 ම ආවරණය වන පරිදි රුපියල් ලක්ෂ 2 ක උපරිම සිමාවකට යටත්ව ඉන්ධන ලබා දෙමින් ඇස්තමේන්තු රහිතව සංවර්ධන කටයුතු සිදුකළ බව දන්වමි. |

**3.5** <u>ප්‍රසම්පාදනය</u>
<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------------- | -------------- | ------------------- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයට පිළියෙල කළ සැලැස්ම විධිමත් නොවූ බැවින් 2020 වර්ෂයට සැලැස්මක් සකස්කර ඇත. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | දැනට අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇති බව දන්වමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සභාව තුළ විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | 2020 වර්ෂයේ පළමු කාර්තුව සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පවත්වා ඇති බව දන්වමි. |